# ප්‍රශංසා එකතු සුපුවත

2017 මැයි මස 01 වෙනි දින සිට මැයි මස 06 වෙනි දින දක්වා

## "ප්‍රථම ත්‍යාගය වන ශුද්ධාත්මයාණන් වහන්සේ "

01 ආරම්භක ප්‍රශංසාව : පුබුදු ගී අංක 07 "සුදත් සුරිඳුනේ අප සිත් සනසා...."

02. ප්‍රශංසාවට යොමුව:

සමිඳාණන් වහන්සේ සිය ජීවිතය පූජා කරමින් වන්දි ගෙවූ මිළය කරණකොට ගෙන ශුද්ධාත්මයාණන් නමැති තිළිණය අපට ප්‍රදානය කළ සේක. කිසිදාක නැති නොවන සදහටම අප සමඟ වැඩ සිටින පිණිස අප ලබා ඇති තිළිණය අපි අයිති කර ගනිමු. අත්දකිමින් ප්‍රශංසා කරමු.

පුබුදු ගී අංක 103 "තුති ප්‍රශංසා වේ ....."

03. දවසේ සුපුවත:

ශු.ජුවාම් 14:16-17 පොදුවේ ප්‍රකාශ කරන්න.

**"එවිට මම පියාණන් වහන්සේගෙන් අයදින්නෙමි. ඔවුන් වහන්සේ ද ඔබ සමඟ සදහටම සිටින පිණිස වෙන සහයදායකයකු දෙන සේක.... මන්ද ඔවුන් වහන්සේ ඔබ සමඟ නැවතී සිටිමින් ඔබ තුළ වැඩ වසන සේක...."**

* සමිඳාණන් වහන්සේ පියාණන් වහන්සේගෙන් අයදින සේක. සහයදායකයාණන් වහන්සේ අපට දානය කරන ලෙසට ඒ සහයදායකයාණන් වහන්සේ ශු.ත්‍රිත්වයේ තුන්වන තෙම වන අපට ප්‍රදානය කරනු ලැබූ ශුද්ධාත්මයාණන් වහන්සේ වන සේක.

* අප ලබා ඇති ප්‍රථම ත්‍යාගය ශුද්ධාත්මයාණන් වහන්සේයි. ශුද්ධාත්මයාණන් වහන්සේ පියාණන් වහන්සේ ලබා දෙන මහගුම දීමනාවයි. ඔවුන් වහන්සේව ලබන පුද්ගලයා වරප්‍රසාදයෙන් පූර්ණ කෙනෙකු බවට පත් වනු ඇත.

* ශුද්ධාත්මයාණන් වහන්සේ නොමැතිව අපට කිසිවක් කළ නොහැකිය. ඒ මන්දයත් අප බලය ලබන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි කලයි. අප දැනුවත්වම ඔවුන් වහන්සේගේ මෙහෙයවීමට නතුවිය යුතුයි. විශ්වය තුළත්, අප තුළත් ක්‍රියාත්මක අභ්‍යන්තර බලය ඔවුන් වහන්සේ වන සේක.

* ක්‍රිස්තුන් වහන්සේ විසින් අපට තෑගි කරන ලද සදාකාලිකවම අප තුළ සදහටම නැවතී සිටින තැනැන් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේ ය. එය කොතෙක් ප්‍රබලවූ අත්දැකීමක්ද කිවහොත් ශු.පාවුළු තුමා ප්‍රකාශ කරනවා,**"ඔබ දෙවියන් වහන්සේගේ මන්දිරය බවත්, ඔබ තුළ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වැඩ වසන බවත් නොදන්නහු ද?"** යනුවෙන් (1කොරෙන්ති 3:16).

04. අප දෙසට :

* අප ලබා ඇති ප්‍රථම ත්‍යාගය වන ශුද්ධාත්මයාණන් වහන්සේව අප ජීවිත තුළ කොතෙක් අත්දකිනවාද?
* ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවන ජීවිතයක් ගත කරන්නට අප ගතයුතු පියවර මොනවාද?
* ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙන් අප ලබා ඇති ස්නාපනය දූතකාර්යය සඳහාය. අප කොතෙක් නම් ඊට අවදිද?

05. සතිය පුරා :

* ආත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම තුළ ජීවත්වීමේ කැඳවීම ලද අප ඔවුන් වහන්සේට අවදි වෙමින් ජීවත් වෙමු.
* ශුද්ධාත්මයාණන් වහන්සේට අවදිවීමේ සත් වැදෑරුම් අවදිවීමට අවදි වෙමු.
* ශුද්ධාත්මයාණන් වහන්සේට අවදිවීමේ පස් වැදෑරුම් අවදිවීම තුළ ජීවත් වෙමු.

06. අවසන් ප්‍රශංසාව -

පුබුදු ගී අංක 377 (නව මුද්‍රණය) 365 (පැරණි මුද්‍රණය) "සුදත් බලයෙන්....."

******************************